# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2393/16 - 2024 ජූලි මස 16 වැනි අඟහරුවාදා - 2024.07.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සළකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජූලි මස 10 වැනි දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර - II,
බත්තරමුල්ල,



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### *බද්දේගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම*

#### *I වන තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005/11/23 දිනැති අංක 1420/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව ගාල්ල බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් සමන්විත බද්දේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දක්ෂිණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති සම්පූර්ණ ග්‍රාම නිලධාරි වසම්වලට අමතරව කොටස් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අංක 186 බද්දේගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද 186C ඇල්ලකන්ද වතුරාව ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 188 හැම්මැලිය ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 198A බද්දේගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, 199 හල්පාතොට ග්‍රාම නිලධාරී වසමේ ඉතිරි කොටසද, 206 වල්පිට උතුර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 206A වල්පිට දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 206B බලගොඩ ග්‍රාම නිලධාරී වසමේ ඉතිරි කොටසද, 206C කීඹි ඇළ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 206E අඳුරත්විල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 220 ගනේගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 220A ගනේගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 220B ගනේගම බටහිර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 220C සන්දරවල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 186D මැයිහේන ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 191A කොකාවල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 191C දෙයියන්දර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 191D කිරින්දලාහේන ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 200 මැදකීඹිය ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 200A මැදකීඹිය නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 200B පිටිහරාව ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද සහ 207A ඉහළ කීඹිය දකුණ වසමේ ඉතිරි කොටසද හා සම්පූර්ණයෙන් ප්‍රකාශයට පත් කිරීමට ඇති ග්‍රාම නිලධාරි වසම් වන අංක 198 ගනේගම උතුර ග්‍රාම නිලධාරි වසම ද, 198B ගොතටුව ග්‍රාම නිලධාරි වසම ද, 199A හල්පාතොට මධ්‍ය ග්‍රාම නිලධාරි වසම ද, 206D ගෝනපුර ග්‍රාම නිලධාරි වසම ද, 188A මහවිලපිටිය ග්‍රාම නිලධාරි වසම ද, 199B වවුලගල ග්‍රාම නිලධාරි වසම ද, 201 කෙරදේවල ග්‍රාම නිලධාරී වසම ද, 201A ගිනිමැල්ලගහ ග්‍රාම නිලධාරි වසම ද, 201B මඩොල්දූව ග්‍රාම නිලධාරි වසම ද, 201C වේවැල්දෙණිය ග්‍රාම නිලධාරි වසම ද, 201D බටකැටිය ග්‍රාම නිලධාරි වසම ද, 202 මාපුවාන ග්‍රාම නිලධාරී වසම ද, 202A ලේල්කඩ ග්‍රාම නිලධාරි වසම ද, 203 ගිනිමැල්ලගහ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම ද, 203A ගිනිමැල්ලගහ දකුණ ග්‍රාම නිලධාරි වසම ද, 203B දොඩන්ගොඩ ග්‍රාම නිලධාරි වසම ද, 203D පිටුවල්ගොඩ ග්‍රාම නිලධාරි වසම ද, 204 තෙලිකඩ ග්‍රාම නිලධාරී වසම ද, 204A තෙලිකඩ නගරය ග්‍රාම නිලධාරී වසම ද, 205 හොරගම්පිට ග්‍රාම නිලධාරි වසම ද, 205A හොරගම්පිට මධ්‍යම ග්‍රාම නිලධාරි වසම ද, 189 මාබොටුවන ග්‍රාම නිලධාරි වසම ද, 189A නාත්තවෙල ග්‍රාම නිලධාරී වසම ද, 189B තලාව ග්‍රාම නිලධාරි වසම ද, 190 ඉහළ ලේල්වල ග්‍රාම නිලධාරි වසම ද, 190A කුඹලමලහේන ග්‍රාම නිලධාරි වසම ද, 190B පන්විල ග්‍රාම නිලධාරි වසම ද, 191 පහළ ලේල්වල ග්‍රාම නිලධාරි වසම ද 191B පොල්ගහවිල ග්‍රාම නිලධාරි

#### *II වන තීරුව*

*උතුරට* :

පෙඩෘසිවත්ත ජනපදය වෙත ගමන් කරන පෙඩෘසිවත්ත මාර්ගයේ මධ්‍ය රේඛාවක් බද්දේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 199A හල්පාතොට මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ආරම්භ වන ලක්ෂ්‍යයත් ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසට අඳින ලද රේඛාවත් අංක 199A හල්පතොට මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 738 ක්, අංක 199 හල්පාතොට ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 222 ක් ඊසාන දෙසටත්, මීටර් 933 ක් ගිණිකොන දෙසටත් මීටර් 760 ක් ඊසාන දෙසටත්, මීටර් 81 ක් නැගෙනහිර දෙසටත් මීටර් 1117 ක් ගිණිකොන දෙසටත් අඳින ලද රේඛාවක්, අංක 184B බද්දේගම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 432 ඊසාන දෙසට, අංක 184 බද්දේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවක්, එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 227 ක් ඊසාන දෙසට, මීටර් 188 ක් ගිණිකොන දෙසට, මීටර් 10 ඊසාන දෙසට, අංක 184C කොටගොඩ ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවක්, එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 1317 ක් ඊසාන දෙසට, අංක 188 හැම්මැලිය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ මීටර් 985 ක් ඊසාන දෙසට අඳින ලද රේඛාවක්, එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට නැවතත් එකී ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම දිගේ මීටර් 2100 ක් ගිණිකොන දෙසටත්, මීටර් 345 ක් ඊසාන දෙසට, මීටර් 897 ක් ගිණිකොන දෙසටත්, අඳින ලද රේඛාවක් අංක 188A මහලපිටිය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම් ලක්ෂ්‍යය ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවක් එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම දිගේ මීටර් 2182 ක් නිරිත දෙසට ගමන් කර අංක 191B පොල්ගහවිල ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ සහ අංක 190A කුඩලමලහේන, අංක 221 වඳුරඹ උතුර යන ග්‍රාම නිලධාරී වසම් වල නැගෙනහිර මායිම දිගේ මීටර් 1748 ක් අංක 221B ගුළුගහකන්ද ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක් ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 590 ක් නැගෙනහිරට ද මීටර් 1643 ක් ගිණිකොන දෙසට අංක 189 මාබොටුවන ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දිගේ මීටර් 1132 ක් ගමන් කර අංක 189B තලාව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ආරම්භ වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ මීටර් 2862 ක් ඊසාන දෙසට හා මීටර් 30 ක් නැගෙනහිර දෙසට ගමන් කර හමුවන ලක්ෂ්‍යයෙන් උතුරු මායිම අවසන් වේ.

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

***බද්දේගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම***

*I වන තීරුව*

වසම ද, 200C තිරුවානාකැටිය ග්‍රාම නිලධාරි වසම ද, 207 ඉහළ කීඹිය ග්‍රාම නිලධාරි වසම ද, 221 වඳුරඹ උතුර ග්‍රාම නිලධාරි වසම ද, 221A වඳුරඹ දකුණ ග්‍රාම නිලධාරි වසම ද, 221B ගුළුගහකන්ද ග්‍රාම නිලධාරි වසමද ඇතුළත් වන්නා වූ මුලුමහත් ප්‍රදේශය ඇතුළත් වේ.

*II වන තීරුව*

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අඳින ලද රේඛාවක් අංක 189B තලාව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම දිගේ මීටර් 384 ක් ද ගිණිකොන දෙසටත් මීටර් 1200 නිරිත දෙසටත් මීටර් 261 ගිණිකොන දෙසටත් මීටර් 280 ඊසාන දෙසටත් අංක 189 මාබොටුවන ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිමේ අවසන් ලක්ෂ්‍යය හා අංක 189A නාන්තවල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ආරම්භ වන ලක්ෂ්‍යයේ සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම දිගේ මීටර් 1410 ක් නිරිත දෙසට ගමන් කර අංක 207 ඉහළකීඹිය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ආරම්භ වන ලක්ෂ්‍යයේ සිට මීටර් 56 ක් නිරිත දෙසටත් මීටර් 270 ක් ගිණිකොන දෙසටත් මීටර් 154 ක් දකුණු දෙසටත් මීටර් 210 ක් ගිණිකොන දෙසටත් මීටර් 1163 නිරිත දෙසටත් මීටර් 380ක් වයඹ දෙසටත් මීටර් 380 ක් නිරිත දෙසටත් ගමන් කර අංක 207A ඉහළකීඹිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ආරම්භය දිගේ මීටර් 240 ක් දකුණු දෙසටත් මීටර් 485 ක් ගිණිකොන දෙසටත් මීටර් 290 ක් නිරිත දෙසටත් ගමන් කර එකී ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම අවසන් වන ලක්ෂ්‍යයෙන් නැගෙනහිර මායිම අවසන් වේ.

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට මීටර් 7106 ක් වයඹ දෙසට අඳින ලද රේඛාවක් අංක 207A ඉහළ කීඹිය දකුණ, අංක 200A මැදකීඹිය නැගෙනහිර, අංක 200 මැදකීඹිය, අංක 208C කොහොඹනාදෙනිය යන ග්‍රාම නිලධාරී වසම් වල දකුණු මායිම දිගේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට අංක 208C කොහොඹනාදෙනිය ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම දිගේ නිරිත දෙසටත්, ගිණිකොන දෙසටත් හා නැවතත් නිරිත දෙසටත්, නරාවල - පෝද්දල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට නරාවල - පෝද්දල මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ අඳින ලද රේඛාවක් අංක 206E අඳුරත්විල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම දිගේ වයඹ හා නිරිත දෙසට අඳින ලද රේඛාවක් අංක 206A වල්පිට දකුණ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර - 206E අඳුරත්විල, ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම දිගේ මීටර් 145 ක් අංක 206A වල්පිට දකුණ ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම අවසන් වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට මීටර් 34 ක් නිරිත දෙසටත් මීටර් 110 ක් දකුණු දෙසටත් මීටර් 638 ක් නිරිත දෙසටත් මීටර් 255 ක් දකුණු දෙසට පන්විල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට මීටර් 21 ක් ගිණිකොන දෙසටත් මීටර් 375 ක් නිරිත දෙසටත් මීටර් 27 ක් දකුණටත් ගමන් කර අංක 206D ගෝනපුර ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හා අංක 206A වල්පිට දකුණ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම අවසන් වන

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

***බද්දේගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම***

*I වන තීරුව*

*II වන තීරුව*

ලක්ෂ්‍යය ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට මීටර් 150 ක් දකුණු දෙසටත් මීටර් 468 ක් නිරිත දෙසටත් හෝලුවාගොඩ ඇළේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට එකී ඇළ මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ මීටර් 2135 ක් ගමන් කර එකී ඇළ හා ගිං ගඟේ මධ්‍ය රේඛාව හා ඇළ මධ්‍ය රේඛාව (ඇනිකට් එක හරහා) ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර ගිං ගඟේ මධ්‍ය රේඛාව දිගේ මීටර් 1100 ක් ගමන් කර හමු වන ලක්ෂ්‍යයේ සිට මීටර් 53 ක් වයඹ දෙසට ගිං ගඟේ ඉවුර දක්වා ගමන් කර එතැන් සිට මීටර් 168 ක් වයඹ දෙසට ගමන් කර හමු වන ඇළ මාර්ග යේ මධ්‍ය රේඛාව දිගේ මීටර් 325 ක් නිරිත දෙසට ගමන් කර ගිං ගඟේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය හා අංක 205 හොරග ම්පිට ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම් ලක්ෂ්‍යය ඡේදනය වන ලක්ෂ්‍යයෙන් දකුණු මායිම අවසන් වේ.

*බස්නාහිරට* :

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 205 හොරගම්පිට ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ අඳින ලද රේඛාවක්, අංක 205A හොරගම්පිට මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම දිගේ වයඹ හා ඊසාන දෙසට අඳින ලද රේඛාවක්, අංක 204A තෙලිකඩ නගරය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ වයඹ, උතුරු හා ඊසාන දෙසට අඳින ලද රේඛාවක්, අංක 203C පිටුවල්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ ඊසාන, වයඹ, බටහිර හා නිරිත දෙසට අඳින ලද රේඛාවක් අංක 203 ගිනිමැල්ලගහ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ, බටහිර මායිම දිගේ වයඹ හා ඊසාන දෙසට අඳින ලද රේඛාවක් අංක 201A ගිනිමැල්ලගහ බටහිර ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ වයඹ ඊසාන දෙසට, අඳින ලද රේඛාවක්, අංක 201B මඩොල්දූව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ ඊසාන හා වයඹ දෙසට අඳින ලද රේඛාවක් අංක 201C වේවැල්දෙණිය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ ඊසාන හා වයඹ දෙසට අඳින ලද රේඛාවක් අංක 199B වවුලගල ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ගමන් කර, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම දිගේ වයඹ හා ඊසාන දෙසට, උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ගමන් කර බටහිර මායිම අවසන් වේ.

EOG 07 - 0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.